# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1981 අංක 57 දරන
# වෙරළ සංරක්ෂණ පනත

---


[සහතිකය සටහන් කළේ 1981 සැප්තැම්බර් මස 09 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1981 සැප්තැම්බර් මස 11 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : රු. 1.30 යි　　　　තැපැල් ගාස්තුව : ශත 75 යි

# 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනත

[සහතිකය සටහන් කළේ 1981 සැප්තැම්බර් මස 09 වන දින]

එල්. ඩී.—ඕ. 98/78.

**වෙරළ කලාපය පිළිබඳ සමීක්ෂණයක් කිරීම සහ වෙරළ කලාපය කළමනාකරණය කිරීමේ සැලැස්මක් පිළියෙළ කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, වෙරළ කලාපය ඇතුළත සංවර්ධන කටයුතු විධිමත් කිරීම හා පාලනය කිරීම පිණිස ද, වෙරළ කලාපය ඇතුළත වෙරළ සංරක්ෂණය සඳහා වැඩ යෝජනා ක්‍රම සකස් කොට ඒවා ක්‍රියාවෙහි යෙදවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, ඇතැම් ලිඛිත නීතිවල අනුයායි සංශෝධන ඇති කිරීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

## I වන කොටස

### පරිපාලනය

2. වෙරළ කලාපයෙහි පරිපාලනය, පාලනය, භාරකාරත්වය සහ කළමනාකරණය ජනරජය වෙත මෙයින් පවරනු ලැබේ. වෙරළ කලාපයෙහි පරිපාලනය ජනරජය වෙත පැවරෙන බව.

3. මේ පනතේ කාර්ය සඳහා— වෙරළ සංරක්ෂණ අධ්‍යක්ෂවරයා සහ වෙනත් නිලධරයෝ.

(අ) මෙහි මින් මතු "අධ්‍යක්ෂවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන වෙරළ සංරක්ෂණ අධ්‍යක්ෂවරයකු පත් කරනු ලැබිය යුතු ය ; තව ද

(ආ) පරිපාලනයෙහි දී සහ මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී අධ්‍යක්ෂවරයාට සහායවීම සඳහා අවශ්‍ය විය හැකි—

(i) නියෝජ්‍ය අධ්‍යක්ෂවරයන් සහ සහකාර අධ්‍යක්ෂවරයන් යම් සංඛ්‍යාවක් ; සහ

(ii) වෙනත් යම් නිලධරයන්

පත් කරනු ලැබිය හැකි ය.

4. (අ) මේ පනතේ විධිවිධාන පරිපාලනය කිරීම සහ ඒ විධිවිධාන ක්‍රියාත්මක කිරීම ; අධ්‍යක්ෂවරයාගේ කාර්ය සහ කර්තව්‍ය.

(ආ) වෙරළ කලාපය ඇතුළත වෙරළ සංරක්ෂණය සඳහා වූ වැඩ යෝජනා ක්‍රම සකස් කිරීම සහ ඒවා ක්‍රියාවෙහි යෙදවීම ; සහ

(ඇ) වෙරළ සංරක්ෂණය කිරීමේ කාර්යය සඳහා වෙනත් දෙපාර්තමේන්තු, නියෝජ්‍යායතන සහ ආයතන සමග සහයෝගිත්වයෙන් පර්යේෂණ පැවැත්වීම

සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයා වගකිව යුතු ය.

III වන කොටස යටතේ වූ ස්වකීය බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් අධ්‍යක්ෂවරයා විසින් දිසාපතිවරයාට පැවරිය හැකි බව.

5. අධ්‍යක්ෂවරයා විසින් ලිඛිතව බලය දෙනු ලැබූ විට සහ අධ්‍යක්ෂවරයාගේ සාමාන්‍ය විධානයට හා පාලනයට යටත්ව, මේ පනතේ III වන කොටසින් අධ්‍යක්ෂවරයා වෙත පවරන ලද හෝ නියම කරන ලද නැතහොත් වෙන්කර දෙන ලද සියලු බලතල, කාර්ය සහ කර්තව්‍ය හෝ ඉන් කිසිවක් හෝ වෙරළ කලාපයේ යම් කොටසක් පිහිටියේ යම් පරිපාලන දිස්ත්‍රික්කයක් ඇතුළත ද ඒ පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා විසින් ඒ පරිපාලන දිස්ත්‍රික්කය ඇතුළත ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ හැකි ය.

වෙරළ සංරක්ෂණ උපදේශක සභාව.

6. (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙරළ සංරක්ෂණ උපදේශක සභාවක් පිහිටුවනු ලැබිය යුතු අතර, එය පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) සභාවේ සභාපතිවරයා විය යුතු, වෙරළ සංරක්ෂණය පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් ධුරය තත් කාලයෙහි දරන තැනැත්තා ;

(ආ) සංචාරක කටයුතු පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයකු ;

(ඇ) නාවුක කටයුතු පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයකු ;

(ඈ) පළාත් පාලනය පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයකු ;

(ඉ) ස්වදේශ කටයුතු පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයකු ;

(ඊ) කර්මාන්ත පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයකු ;

(උ) සභාවේ ලේකම් වශයෙන් ක්‍රියා කළ යුතු අධ්‍යක්ෂ ධුරය තත් කාලයෙහි දරන තැනැත්තා ;

(ඌ) ජලජ සම්පත්, පර්යේෂණ කටයුතු හා සංවර්ධනය සම්බන්ධයෙන් වගකිව යුතු ආයතනයේ අධ්‍යක්ෂවරයා හෝ වෙනත් තැනැත්තකු ;

(එ) ඉඩම් කොමසාරිස් ධුරය තත් කාලයෙහි දරන තැනැත්තා හෝ ඔහුගේ නියෝජිතයා ;

(ඒ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතින් පිහිටුවන ලද නාගරික සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරි ධුරය තත් කාලයෙහි දරන තැනැත්තා හෝ ඔහුගේ නියෝජිතයා ;

(ඔ) වාරිමාර්ග අධ්‍යක්ෂ ධුරය තත් කාලයෙහි දරන තැනැත්තා හෝ ඔහුගේ නියෝජිතයා ; සහ

(ඕ) අමාත්‍යවරයා විසින් පත් කරන ලද වෙනත් සාමාජිකයන් තිදෙනෙක් ; ඔවුන් අතුරින් එක් සාමාජිකයකු ශ්‍රී ලංකාවේ එක් විශ්ව විද්‍යාලයක ආචාර්ය මණ්ඩලයේ සාමාජිකයකු විය යුතු ය ; එක් සාමාජිකයකු වෙරළ පරිසරය හා සම්බන්ධ ස්වෙච්ඡා සංවිධාන නියෝජනය කරන සාමාජිකයකු විය යුතු ය ; අනෙක් සාමාජිකයා ධීවර කර්මාන්තය නියෝජනය කරන සාමාජිකයකු විය යුතු ය.

මේ ඡේදය යටතේ පත් කරන ලද සාමාජිකයකු මෙහි මින් මතු " පත් කරන ලද සාමාජිකයා " යනුවෙන් සඳහන් කරනු ලැබේ.

7. සභාවේ කර්තව්‍ය පහත සඳහන් පරිදි විය යුතු ය :— සභාවේ කර්තව්‍ය.

(අ) වෙරළ කලාපයෙහි ආරම්භ කිරීමට යෝජිත සියලු සංවර්ධන කටයුතු පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් දීම ;

(ආ) මේ පනතේ II වන කොටසේ විධිවිධාන අනුව පිළියෙළ කරන ලද වෙරළ කලාපය කළමනාකරණය කිරීමේ සැලැස්ම සමාලෝචනය කිරීම සහ ඒ පිළිබඳව යම් නිර්දේශ ඇතොත්, ඒ නිර්දේශ අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කිරීම ;

(ඇ) 14 වන වගන්තිය යටතේ අවසර පත්‍ර සඳහා වූ ඉල්ලුම් කිරීම් හා සම්බන්ධව අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කරන ලද පරිසරය කෙරෙහි බලපෑම පිළිබඳ තක්සේරු කිරීම්, සමාලෝචනය කිරීම සහ ඒ පිළිබඳව යම් අදහස් ඇතොත් ඒ අදහස් අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කිරීම ;

(ඈ) වෙරළ කලාපය ඇතුළත වැඩ යෝජනා ක්‍රම සඳහා අවශ්‍යතාව ඇති වන කවර හෝ විටක ඒ අවශ්‍යතාව පිළිබඳව අධ්‍යක්ෂවරයා වෙත දැනුම් දීම ; සහ

(ඉ) අවස්ථාවෝචිත පරිදි, අමාත්‍යවරයා හෝ අධ්‍යක්ෂවරයා හෝ විසින් සභාව වෙත යොමු කරනු ලබන වෙරළ සංරක්ෂණ යට අදාළ වෙනත් යම් කාරණයක් පිළිබඳව, අවස්ථා වෝචිත පරිදි, අමාත්‍යවරයාට හෝ අධ්‍යක්ෂවරයාට හෝ උපදෙස් දීම.

8. (1) සභාවේ පත් කරන ලද සෑම සාමාජිකයකු ම මරණය, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම හෝ හේතු කොට ගෙන තම ධුරය කලින් හිස් කරනහොත් මිස, අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු ය. සභාවේ පත් කරන ලද සාමාජිකයන් ගේ ධුර කාලය.

(2) සභාවේ පත් කරන ලද යම් සාමාජිකයකු ධුරයෙන් ඉවත් කිරීම අවශ්‍යතාවෝචිත යයි අමාත්‍යවරයා සලකන්නේ නම්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින්, අමාත්‍යවරයා විසින් කිසිම හේතුවක් නොදක්වා එසේ කළ හැකි අතර ඒ ඉවත් කිරීම කිසිම අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(3) පත් කරන ලද සාමාජිකයකු විසින් තමා ධුරයෙන් ඉල්ලා අස්වන බවට අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් කවර හෝ අවස්ථාවක තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(4) සභාවේ පත් කරන ලද සාමාජිකයකු මිය ගියහොත් හෝ ධුරයෙන් ඉල්ලා අස් වුවහොත් හෝ ඉවත් කරනු ලැබුවහොත් හෝ එසේ මිය ගිය, ධුරයෙන් ඉල්ලා අස් වූ හෝ ඉවත් කරනු ලැබූ සාමාජිකයා වෙනුවට වෙනත් යම් තැනැත්තකු අමාත්‍යවරයා විසින්, 6 වන වගන්තියේ (ඕ) ඡේදයේ විධිවිධාන කෙරෙහි සැලකිලිමත්ව පත් කරනු ලැබිය හැකි ය.

(5) (4) වන උපවගන්තිය යටතේ පත් කරන ලද සාමාජිකයකු මරණය, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීම හේතු කොට ගෙන තම ධුරය කලින් හිස් කරනහොත් මිස, ඔහු තම පූර්වගාමියාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කොටස සඳහා ධුරය දැරිය යුතු ය.

(6) රෝගාතුර වීම, අබලතාව හෝ මාස තුනකට නොඅඩු කාලයක් තුළ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හේතුකොට ගෙන සභාවේ පත් කරන ලද සාමාජිකයකුට තම ධුරයේ කාර්යය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, අමාත්‍යවරයා වෙත ඒ බව ලිඛිතව දැනුම් දීම ඒ සාමාජිකයාගේ කාර්යය විය යුතු ය. අමාත්‍යවරයා විසින් 6 වන වගන්තියේ (ඕ) ඡේදයේ විධිවිධාන කෙරෙහි සැලකිලිමත්ව, ඒ සාමාජිකයා වෙනුවෙන් කටයුතු කිරීමට වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(7) ඉවත් කරනු ලැබීමෙන් හැර ධුරය හිස් කරන සභාවේ පත් කරන ලද යම් සාමාජිකයෙක් නැවත පත් කිරීම සඳහා සුදුස්සෙක් වන්නේ ය.

යම් පුරප්පාඩුවක් තිබීම හෝ සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීම හේතු කොටගෙන සභාවේ ක්‍රියා හෝ කටයුතු අවලංගු වෙනැයි සලකනු නොලැබිය යුතු බව.

9. සභාවේ යම් පුරප්පාඩුවක් හෝ සභාවේ සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් හෝ තිබීමේ හේතුව නිසා ම පමණක් සභාවේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක් හෝ අවලංගු නොවිය යුතු ය.

සභාවේ රැස්වීම.

10. (1) යටත් පිරිසෙයින් සෑම මාස දෙකකට වරක් හෝ සභාවේ රැස්වීමක් පවත්වනු ලැබිය යුතු ය.

(2) සභාපතිවරයා හෝ ඔහු පැමිණ නොමැති විටක අධ්‍යක්ෂවරයා හෝ ඒ දෙදෙනාම පැමිණ නොමැති විටක පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා පත් කර ගනු ලබන සාමාජිකයකු හෝ සභාවේ රැස්වීම්වල මූලාසනය දැරිය යුතු ය.

(3) සභාවේ යම් රැස්වීමක දී තීරණය කළ යුතු සියලු ප්‍රශ්න පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කළ යුතු ය. ඡන්ද සංඛ්‍යාව සමාන වූ අවස්ථාවක මූලාසනය දරන සාමාජිකයාට තීරක ඡන්දයක් ඇත්තේ ය.

(4) සභාවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් තුන් දෙනකු විය යුතු අතර, මේ වගන්තියේ විධිවිධානවලට යටත්ව සභාව විසින් ස්වකීය කාර්ය පටිපාටිය විධිමත් කරගනු ලැබිය හැකි ය.

## II වන කොටස

### වෙරළ කලාපය කළමනාකරණය කිරීම

11. (1) නියමිත දිනයට පසු හැකි ඉක්මණින් වෙරළ කලාපය සමීක්ෂණය කිරීමට අධ්‍යක්ෂවරයා විසින් කටයුතු සැලැස්විය යුතු අතර, ඒ සමීක්ෂණයේ ප්‍රතිඵල පදනම් කරගත් වාර්තාවක් ඔහු විසින් පිළියෙළ කළ යුතු ය. පහත දැක්වෙන දෑ ඒ වාර්තාවෙහි ඇතුළත් විය යුතු ය:— වෙරළ කලාපය ඇනීම.

(අ) වෙරළ කලාපයේ පිහිටි සියලු ඉදිකිරීම්, පාරවල්, කැණීම්, වරායවල්, මෝයවල්, කසලබිම් සහ වෙනත් කර්මාන්ත පිළිබඳ ලැයිස්තුවක්;

(ආ) වෙරළ කලාපය ඇතුළත සොයා ගනු ලැබූ සියලු හිරිගල් පර පිළිබඳ ලැයිස්තුවක්;

(ඇ) වෙරළ කලාපය ඇතුළත පිහිටා ඇතැයි පැහැදිලි වී ඇති සහ ඇතැයි සැක කරනු ලබන, වාණිජ වශයෙන් උපයෝගී කර ගත හැකි සියලු ඛනිජ ඉල්ලම් පිළිබඳ ලැයිස්තුවක්;

(ඈ) වෙරළ කලාපය ඇතුළත පිහිටි විනෝදාත්මක ස්නානය සඳහා ඉතාමත් ම යෝග්‍ය ප්‍රදේශ ද ඇතුළුව ආගමික වටිනාකමක් හෝ විශිෂ්ඨ දර්ශනීය වටිනාකමක් හෝ විනෝදාත්මක කාර්ය සඳහා වටිනාකමක් හෝ ඇති, සියලු ප්‍රදේශ පිළිබඳ ලැයිස්තුවක්;

(ඉ) මත්ස්‍ය ජලාශ හෝ වනසත්ව නිජබිම් වශයෙන් ඇති වැද ගත්කම දක්වමින් වෙරළ කලාපය ඇතුළත පිහිටි සියලු මෝය බඩ ප්‍රදේශ හෝ තෙත්බිම් ප්‍රදේශ පිළිබඳ ලැයිස්තුවක්;

(ඊ) මත්ස්‍යයින් සහ බෙල්ලන් වසන ජලාශ, මුහුදුකැම, වෙරළ බඩ වෙනස්වීම් සහ ඒ හා ආශ්‍රිත කරුණු ඇතුළුව, වෙරළ බඩ ප්‍රපංච හා සම්බන්ධ පර්යේෂණ සඳහා විශේෂ වටිනාකමක් ඇති වෙරළ කලාපය ඇතුළත වූ සියලු ප්‍රදේශ පිළිබඳ ලැයිස්තුවක්;

(උ) වාණිජ හෝ කාර්මික කාර්ය සඳහා හිරිගල්, වැලි, සිප්පිකටු හෝ වෙනත් ද්‍රව්‍ය නිතිපතා ඉවත් කරනු ලබන වෙරළ කලාපය ඇතුළත වූ සියලු ප්‍රදේශ පිළිබඳ ලැයිස්තුවක්;

(ඌ) මුහුදු කැම් හේතුවෙන් නැති වී යන ගොඩබිම් ප්‍රමාණයේ භූගෝලීය පිහිටීම දක්වමින් කරනු ලබන ප්‍රමාණකෘත දර්ශනයක් ඇතුළුව වෙරළ කලාපය කෙරෙහි මුහුදු කැමෙහි බලපෑමේ ප්‍රමාණය පිළිබඳ තක්සේරුවක්, එසේ ගොඩබිම

නැති වී යාමෙන් සිදුවන ආර්ථික හානිය පිළිබඳ ඇස්තමේන්තුවක් සහ එසේ නැති වී යාමට මිනිස් ක්‍රියාවලිය හේතුභූත වී ඇති ප්‍රමාණය පිළිබඳ ඇස්තමේන්තුවක් ;

(එ) වෙරළ කලාපයෙන් ඉවත් කරනු ලබන වැලි, හිරිගල්, සිප්පිකටු සහ වෙනත් ද්‍රව්‍යවල ප්‍රමාණයන් වෙනත් ප්‍රභවයන්ගෙන් හෝ වෙනත් ද්‍රව්‍යවලින් සපයනු ලැබිය හැක්කේ කොතෙක් දුරට ද යන වග පිළිබඳ ඇස්තමේන්තුවක් සහ එසේ කිරීමේ ආර්ථික ප්‍රායෝගිකතාව පිළිබඳ විශ්ලේෂණයක් ද සමඟ, වෙරළ කලාපයෙන් ඉවත් කරනු ලබන වැලි, හිරිගල්, සිප්පිකටු සහ වෙනත් ද්‍රව්‍යවල ප්‍රමාණය පිළිබඳ ඇස්තමේන්තුවක් ; සහ

(ඒ) වෙරළ කලාපයෙන් හිරිගල්, වැලි, සිප්පිකටු, හෝ වෙනත් ද්‍රව්‍ය ඉවත් කිරීමෙහි දී නිත්‍ය පදනමක් මත දැනට යොදවා සිටින සියලු කම්කරුවන් භූගෝලීය ප්‍රදේශ අනුව සහ ඔවුන්ගේ ක්‍රියාකාරීත්ව අනුව වර්ග කරන ලද සංගණනයක්, ඒ කම්කරුවන්ගෙන් යැපෙන්නන් පිළිබඳ සංගණනයක් සහ ඒ කටයුතුවලින් ලබා ගන්නා ලද ඒක පුද්ගල ආදායම පිළිබඳ ඇස්තමේන්තුවක්.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ වාර්තාව සකස් කිරීමේ දී ආණ්ඩුවේ දෙපාර්තමේන්තු, ආයතන සහ වෙනත් නියෝජ්‍යායතන විසින් රැස්කරන ලද හෝ සම්පාදනය කරන ලද අදාළ දත්ත සහ තොරතුරු කෙරෙහි අධ්‍යක්ෂවරයා සැලකිලිමත් විය යුතු ය. තවද, ඒ වාර්තාව සකස් කිරීමේ කාර්ය සඳහා අධ්‍යක්ෂවරයාට යුක්ති සහගත ලෙස අවශ්‍ය විය හැකි එවැනි යම් දත්ත හෝ තොරතුරු සැපයීම ඒ දෙපාර්තමේන්තුවල, ආයතනවල හෝ නියෝජ්‍යායතනවල ප්‍රධානයන්ගේ යුතුකම විය යුතු ය.

වෙරළ කලාපය කළමනාකරණය කිරීමේ සැලැස්ම.

**12.** (1) 11 වන වගන්තිය ප්‍රකාර කරන ලද සමීක්ෂණයේ ප්‍රතිඵල පදනම් කරගත් (මෙහි මින් මතු "සැලැස්ම" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙරළ කලාපය කළමනාකරණය කිරීමේ සවිස්තරාත්මක සැලැස්මක් නියමිත දිනයෙන් පසු අවුරුදු තුනක් ගතවීමට පෙර අධ්‍යක්ෂවරයා විසින් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය. පහත දැක්වෙන දෑ ඒ සැලැස්මෙහි ඇතුළත් විය යුතු ය :—

(අ) වෙරළ කලාපයෙහි විශේෂ සංවර්ධන කටයුතුවල යෝග්‍යතාව තීරණය කිරීමේ දී උපයෝගී කරගනු ලැබිය යුතු මාර්ගෝපදේශ ;

(ආ) වෙරළ කලාපය ඇතුළත පහත දැක්වෙන විෂයයන් සම්බන්ධයෙන් වූ යෝජනා :—

(i) ඉඩම් පාවිච්චි කිරීම ;

(ii) ප්‍රවාහන පහසුකම් ;

(iii) ස්වාභාවික දර්ශන සහ වෙනත් ස්වාභාවික සම්පත් ආරක්ෂා කිරීම සහ කළමනාකරණය කිරීම ;

(iv) විනෝද කටයුතු සහ සංචාරක කටයුතු ;

(v) අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම්, වරායවල් සහ විදුලි යන්ත්‍රාගාර ඇතුළුව පොදු කර්මාන්ත සහ පහසුකම් ;

(vi) ඛනිජ ද්‍රව්‍ය නිශ්කර්ෂණය කිරීම ;

(vii) ජීවී සම්පත් ;

(viii) ජනාවාස ;

(ix) කෘෂිකර්මාන්තය ; සහ

(x) කර්මාන්ත ;

(ඈ) ඇතැම් ප්‍රයෝජන සඳහා වෙරළ කලාපයෙහි ඉඩම් හෝ ජල කොටස් වෙන් කිරීම සඳහා හෝ වෙරළ කලාපයේ ඇතැම් ප්‍රදේශයන්හි ඇතැම් කටයුතු තහනම් කිරීම සඳහා වූ යෝජනා ;

(ඇ) වෙරළ කලාපය වඩා ඵලදායි ලෙස විධිමත් කිරීමේ සෘජු ප්‍රතිඵලයක් වශයෙන් විස්ථාපනය වන මිනිස් බලය උපයෝගී කර ගැනීම සඳහා පරිපූර්ණ වැඩ සටහනක් ; සහ

(ඉ) වෙරළ සංරක්ෂණය කිරීමේ කාර්ය සම්බන්ධයෙන් ආණ්ඩුවේ ප්‍රතිපත්ති සහ බලතල ශක්තිමත් කිරීම සහ පර්යේෂණ පැවැත්වීම සඳහා වූ නිර්දේශ.

(2) අධ්‍යක්ෂවරයා විසින් සභාව වෙත සැලැස්ම ඉදිරිපත් කරනු ලැබූ දින සිට දින හැටක් ඇතුළත, සභාව විසින් සැලැස්ම සම්බන්ධයෙන් යම් සුළු වශයෙන් වූ වෙනස් කිරීම් වෙතොත්, ඒ සුළු වශයෙන් වූ වෙනස් කිරීම් කර, තාවකාලික ලෙස අනුමත කිරීම සඳහා ඒ සැලැස්ම අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා වෙත සැලැස්ම ඉදිරිපත් කරනු ලැබූ විට, අමාත්‍යවරයා විසින් එය මහජනයා විසින් පරීක්ෂා කිරීම සඳහා ලබා ගැනීමට සැලැස්විය යුතු ය. මහජනයා විසින් පරීක්ෂා කිරීම සඳහා සැලැස්ම ලබා ගැනීමට සලස්වන ලද දින සිට දින හැටක් ඇතුළත, ඒ පිළිබඳව වූ යම් අදහස් දැක්වීම් කවර හෝ තැනැත්තකු විසින් අමාත්‍යවරයා වෙත ලිඛිතව ඉදිරිපත් කළ හැකි ය.

(4) (3) වන උපවගන්තියෙහි සඳහන් දින හැටක කාලය අවසානයේ දී, ඒ උපවගන්තිය යටතේ අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලද යම් අදහස් දැක්වීම් කෙරෙහි සැලකිලිමත්ව, අවශ්‍ය යයි අමාත්‍යවරයා විසින් අදහස් කරන යම් මඳ වශයෙන් වූ වෙනස් කිරීම් වෙතොත්, ඒවාට යටත්ව අමාත්‍යවරයා විසින් සැලැස්ම තාවකාලිකව අනුමත කරනු ලැබිය හැකි අතර අවසාන අනුමතය සඳහා ඔහු විසින් ඒ සැලැස්ම අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. අමාත්‍ය මණ්ඩලය විසින් සැලැස්ම අනුමත කරනු ලැබූ විට, අමාත්‍යවරයා විසින්, සැලැස්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමට සැලැස්විය යුතු ය. එසේ පළ කරනු ලැබූ දිනයෙහි හෝ එහි සඳහන් යම් පසු දිනයක හෝ සැලැස්ම ක්‍රියාත්මක විය යුතු ය.

(5) සැලැස්ම ක්‍රියාත්මක වන දිනයෙහි සිට ආරම්භ වන අවුරුදු හතරක කාලය තුළ සහ සැලැස්මේ සෑම ප්‍රතිශෝධනයකම දින සිට අවුරුදු හතරක කාලය ඇතුළත සැලැස්ම ප්‍රතිශෝධනය කරනු ලැබිය යුතු අතර, (2) වන, (3) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ සෑම ප්‍රතිශෝධනයක් සම්බන්ධයෙන් ම අදාළ විය යුතු ය.

(6) මහජනයා විසින් පෙර වෙරළ පාවිච්චි කිරීම හෝ වෙරළ කලාපය ඇතුළත යම් සංවර්ධන කටයුත්තක් හෝ විධිමත් කෙරෙන නියෝග ද ඇතුළුව සැලැස්මේ විධිවිධාන කිසිවක් බලගැන්වීම සඳහා අවශ්‍ය නියෝග, සභාවේ නිර්දේශ මත අමාත්‍යවරයා විසින් සාදනු ලැබිය හැකි ය.

(7) මහජනයා විසින් පෙර වෙරළ පාවිච්චි කිරීම සීමා කෙරෙන හා පාලනය කෙරෙන හෝ වෙරළ කලාපය ඇතුළත යම් සංවර්ධන කටයුත්තක් තහනම් කෙරෙන හෝ පාලනය කෙරෙන නියෝග ද ඇතුළුව සැලැස්මේ විධිවිධාන කිසිවක් බල ගැන්වීම සඳහා අවශ්‍ය නියෝග අමාත්‍යවරයා විසින් සාදනු ලැබිය හැකි ය.

අවසර පත්‍ර නිකුත් කිරීමේ දී අනුගමනය කළ යුතු උපමාන අමාත්‍යවරයා විසින් නියම කළ යුතු බව.

13. නියමිත දිනයට පසු සහ සැලැස්ම ක්‍රියාත්මක වන දිනයට පෙර 14 වන වගන්තිය යටතේ අවසර පත්‍රයක් සඳහා අධ්‍යක්ෂවරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, ඒ වගන්තිය යටතේ අවසර පත්‍රයක් නිකුත් කළ යුතු ද යන වග නිශ්චය කිරීමේ දී උපයෝගී කරගනු ලැබිය යුතු උපමාන, අමාත්‍යවරයා විසින්, වෙරළ කලාපයේ දීර්ඝ කාලීන ස්ථායිතාව, ඵලදායකත්වය සහ පරිසරයේ තත්ත්වය කෙරෙහි සැලකිලිමත්ව නියම කළ හැකි ය.

## III වන කොටස

## අවසර පත්‍ර පිළිබඳ කාර්ය පටිපාටිය

අවසර පත්‍ර නිකුත් කිරීම.

14. (1) වෙනත් යම් නීතියක විධිවිධානවල කුමක් සඳහන් වුව ද, අධ්‍යක්ෂවරයා විසින් තත් කාර්යය සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයක අධිකාරය යටතේ හැර කිසිම තැනැත්තකු විසින් වෙරළ කලාපය ඇතුළත යම් සංවර්ධන කාර්යයක නිරත නොවිය යුතු ය.

(2) වෙරළ කලාපයේ දීර්ඝ කාලීන ස්ථායිතාව, ඵලදායකත්වය සහ පරිසරයේ තත්ත්වය කෙරෙහි එම සංවර්ධන කටයුතුවලින් ඇතිවන බලපෑම් පිළිබඳව සැලකිලිමත්ව, (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන අවසර පත්‍රයක් නො මැතිව, වෙරළ කලාපය ඇතුළත නිරත විය හැකි සංවර්ධන කාර්ය වර්ග අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි ය.

(3) වෙරළ කලාපය ඇතුළත යම් සංවර්ධන කාර්යයක නිරත වීමට අවසර පත්‍රයක් සඳහා වූ ඉල්ලීමක් නියමිත ආකාරයට අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එවැනි සෑම ඉල්ලීමක් ම නියමිත ආකෘතිය අනුව විය යුතු අතර නියමිත විස්තර එහි ඇතුළත් විය යුතු ය. තව ද නියමිත ගාස්තුව ඒ සමඟ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

අවසර පත්‍ර නිකුත් කිරීම සඳහා වූ කොන්දේසි.

15. යෝජිත සංවර්ධන කාර්යය—

(අ) වෙරළ කලාපය කළමනාකරණය කිරීමේ සැලැස්මට සහ ඒ සැලැස්ම බලාත්මක කිරීමට සාදන ලද යම් නියෝගවලට අනුකූල වන්නේ නම් හෝ ඉල්ලුම් පත්‍රය ලැබුනේ ඒ සැලැස්ම ක්‍රියාත්මක වීමේ දිනයට පෙර නම් 13 වන වගන්තිය යටතේ නියමිත උපමාන සැහීමට පත්කර ඇත්නම්; සහ

(ආ) වෙරළ කලාපයේ ස්ථායිතාව, ඵලදායකත්වය සහ පරිසර යේ තත්ත්වය කෙරෙහි අනාකාරයකින් හානිකර බල පෑමක් ඇති නොකරන්නේ නම්

මිස මේ කොටස යටතේ කිසිම අවසර පත්‍රයක් අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කරනු නොලැබිය යුතු ය.

16. (1) වෙරළ කලාපය ඇතුළත සංවර්ධන කාර්යයක නිරත වීමට අවසර පත්‍රයක් සඳහා ඉල්ලීමක් ලැබුණු විට ඒ සංවර්ධන කාර්යයට අදාළ පරිසරය කෙරෙහි බලපෑම පිළිබඳ තක්සේරු කිරීමක් සපයන ලෙස අධ්‍යක්ෂවරයා විසින් ඉල්ලුම්කරුට නියම කරනු ලැබිය හැකි අතර, ඒ නියමය අනුව ක්‍රියා කිරීම ඉල්ලුම්කරුගේ යුතුකම විය යුතු ය. මේ වගන්තිය යටතේ සපයන ලද, පරිසරය කෙරෙහි බල පෑම පිළිබඳ සෑම තක්සේරු කිරීමක ම නියම කරනු ලැබිය හැකි යම් විස්තර ඇතුළත් විය යුතු ය.

පරිසරය කෙරෙහි බල පෑම පිළිබඳ තක්සේරු කිරීම.

(2) ඉල්ලුම්කරුවකු වෙත (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් නියමයක් අනුව ක්‍රියා කරමින් ඒ ඉල්ලුම්කරු විසින් අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කරන ලද පරිසරය කෙරෙහි බලපෑම පිළිබඳ තක්සේරුවක් ලැබුණු විට අධ්‍යක්ෂවරයා විසින්—

(අ) සභාවේ අදහස් කිසිවක් ඇත්නම්, ඒවා දැක්වීම සඳහා ඒ තක්සේරුවේ පිටපතක් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය ; තව ද

(ආ) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීමක් මගින් මහ ජනයා විසින් පරීක්ෂා කරනු ලැබීම පිණිස ඒ තක්සේරුව ලබා ගත හැකි ස්ථානය සහ වේලාවන් පිළිබඳව දැනුම් දිය යුතු ය. තව ද, ඒ පිළිබඳව යම් අදහස් දැක්වීම් වෙතොත්, ඒ අදහස් දැක්වීම් ඉදිරිපත් කිරීමට මහජන යාට ආරාධනය කළ යුතු ය.

(3) (අ) (1) වන උපවගන්තිය යටතේ සභාව වෙත පරිසරය කෙරෙහි බලපෑම පිළිබඳ තක්සේරුවක් ඉදිරිපත් කරනු ලැබූ දින සිට දින හැටක් ඇතුළත, සභාව විසින් ඒ පිළිබඳව යම් අදහස් දැක්වීම් වෙතොත් ඒ අදහස් දැක්වීම් අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය ;

(ආ) ඒ තක්සේරුවට අදාළ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ වූ දැන්වීමක් ගැසට් පත්‍රයෙහි පළ කරන ලද දිනයෙහි සිට දින තිහක් ඇතුළත මහජන යාගෙන් යම් තැනැත්තකුට ඒ පිළිබඳව, යම් අදහස් දැක්වීම් වෙතොත් ඔහු විසින් ඒ අදහස් දැක්වීම් අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(4) වෙරළ කලාපය ඇතුළත සංවර්ධන කාර්යයක නිරත වීමට යම් තැනැත්තකුට බලය දෙමින් 14 වන වගන්තිය යටතේ අවසර පත්‍රයක් නිකුත් කළ යුතු ද යන වග තීරණය කිරීමේ දී ඒ කාර්ය යට අදාළ පරිසරය කෙරෙහි බලපෑම පිළිබඳ තක්සේරුව සම්බන්ධ යෙන් (3) වන උපවගන්තිය යටතේ යම් අදහස් දැක්වීම් කර

තිබුනේ නම් ඒ අදහස් දැක්වීම් කෙරෙහි ද ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ විධිවිධාන යටතේ නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශිත යම් ප්‍රදේශයක නාගරික සංවර්ධන අධිකාරිය විසින් ආරම්භ කරන ලද සංවර්ධන යෝජනා ක්‍රම කිසිවක් කෙරෙහි ද අධ්‍යක්ෂවරයා සැලකිලිමත් විය යුතු ය.

(5) (3) වන උපවගන්තිය යටතේ කරන ලද අදහස් දැක්වීම් කිසිවක් තමා වෙත ලැබී දින හැටක් ඇතුළත අධ්‍යක්ෂවරයා විසින් (4) වන උපවගන්තියෙහි සඳහන් තීරණය කළ යුතු ය.

අවසර පත්‍ර වල ඇතුළත් කොන්දේසි.

**17.** වෙරළ කලාපය කළමනාකරණය කිරීමේ සැලැස්ම හෝ වෙරළ සංරක්ෂණය කිරීම සඳහා වූ යම් වැඩ යෝජනා ක්‍රමයක් කෙරෙහි සැලකිලිමත්ව වෙරළ කලාපයේ නිසි කළමනාකාරිත්වය සඳහා අවශ්‍ය යයි අධ්‍යක්ෂවරයා සලකන යම් කොන්දේසි, මේ කොටස යටතේ නිකුත් කරනු ලබන යම් අවසර පත්‍රයක අධ්‍යක්ෂවරයා විසින් ඇතුළත් කරනු ලැබිය හැකි ය.

අවසර පත්‍රය වලංගු වන කාලය සහ එය අලුත් කිරීම.

**18.** (1) 14 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන අවසර පත්‍රයක් අධ්‍යක්ෂවරයා විසින් එහි නියම කරනු ලබන යම් කාලයක් තුළ බලාත්මකව පැවතිය යුතු ය.

(2) අවසර පත්‍ර හිමියකු විසින්, ඒ අවසර පත්‍රයේ කාලය ඉකුත් වීමේ දිනයට එක් මාසයකට නොඅඩු කාලයකට පෙර ඒ අවසර පත්‍රය අලුත් කිරීම සඳහා ඉල්ලුම් කළ හැකි ය. අවසර පත්‍රයක් අලුත් කිරීම සඳහා වූ ඉල්ලීමක් නියමිත ආකෘතියෙහි විය යුතු අතර නියමිත ගාස්තුව ඒ සමඟ ඉදිරිපත් කළ යුතු ය.

(3) අවසර පත්‍ර හිමියකු විසින් ඒ අවසර පත්‍රය වෙනත් තැනැත්තකුට පැවරීමට අපේක්ෂා කරන අවස්ථාවක, ඔහු විසින් ඒ පැවරීම සඳහා අවසරය අධ්‍යක්ෂවරයාගෙන් ඉල්ලා සිටිය හැකි අතර, නියමිත ගාස්තුව ගෙවීමට යටත්ව, අධ්‍යක්ෂවරයා විසින් ඒ පැවරීමට අවසරය නියමයක් මගින් දෙනු ලැබිය හැකි ය.

අවසර පත්‍රයක කොන්දේසි වෙනස් කිරීම.

**19.** (අ) අවසර පත්‍ර හිමියා විසින් යම් අවසර පත්‍රයක ඇතුළත් කොන්දේසිවලින් යම් කොන්දේසියක් කඩ කර ඇති බවට ; හෝ

(ආ) වෙරළ කලාපයේ නිසි කළමනාකාරිත්වය සඳහා අවසර පත්‍රය වෙනස් කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ අවශ්‍ය සහ අවස්ථාවෝචිත බවට

අධ්‍යක්ෂවරයා සෑහීමට පත්වන්නේ නම්, 14 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද යම් අවසර පත්‍රයක ඇතුළත් කොන්දේසි වෙනස් කරමින් නැතහොත් ඒ අවසර පත්‍රය ප්‍රත්‍යාදිෂ්ට කරමින් හෝ නියමයක් අධ්‍යක්ෂවරයා විසින් කළ හැකි ය.

14 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක ඇති කොන්දේසි වෙනස් කරමින් හෝ ඒ අවසර පත්‍රය ප්‍රත්‍යාදිෂ්ට කරමින් හෝ අධ්‍යක්ෂවරයා විසින් කරන ලද නියමයක ඊට හේතු දක්වා තිබිය යුතු ය. තව ද ඒ නියමයේ පිටපතක් අවසර පත්‍ර හිමියා වෙත භාර දෙනු ලැබීමට අධ්‍යක්ෂවරයා විසින් සැලැස්විය යුතු ය.

වෙරළ සංරක්ෂණ යෝජනා ක්‍රම ක්‍රියාවෙහි යෙදවීම.

**20.** (1) අවසර පත්‍ර හිමියා විසින් යම් වැඩ යෝජනා ක්‍රමයක් ක්‍රියාවෙහි යෙදවිය යුතු යයි 14 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක ඇතුළත් යම් කොන්දේසියක් මගින් අණ කර ඇත්තා වූ ද ඒ වැඩ යෝජනා ක්‍රමය ක්‍රියාවෙහි යෙදවීම අවසර පත්‍ර හිමියා විසින් පැහැර හැර ඇත්තා වූ ද අවස්ථාවක, අධ්‍යක්ෂවරයා විසින්, ලිඛිත දැන්වීමක් මගින්, ඒ දැන්වීමෙහි සඳහන් යම් කාලයක් ඇතුළත ඒ වැඩ යෝජනා ක්‍රමය ක්‍රියාවෙහි යෙදවීම ආරම්භ කරන ලෙස අවසර පත්‍ර හිමියාට අණ කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් නිකුත් කරනු ලැබුවේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා විසින්, ඒ දැන්වීමෙහි සඳහන් වැඩ යෝජනා ක්‍රමය එහි සඳහන් කාලය ඇතුළත ක්‍රියාවෙහි යෙදවීම පැහැර හරින අවස්ථාවක, ඊට කරුණු දැක්වීමට අවස්ථාවක් ඒ තැනැත්තාට දීමෙන් පසුව අධ්‍යක්ෂවරයා විසින් ඒ වැඩ යෝජනා ක්‍රමය ක්‍රියාවෙහි යෙදවිය හැකි අතර ඒ සම්බන්ධයෙන් දරන ලද වියදම් ඒ තැනැත්තාගෙන් අය කර ගැනීමට අධ්‍යක්ෂවරයාට හිමිකම ඇත්තේ ය.

අභියාචන.

**21.** 14 වන වගන්තිය යටතේ අවසර පත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරමින් අධ්‍යක්ෂවරයා විසින් කරන ලද නියමයකින් හෝ, එවැනි යම් අවසර පත්‍රයක් පැවරීමට අවසර දීම ප්‍රතික්ෂේප කරමින් 18 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ අධ්‍යක්ෂවරයා විසින් කරන ලද නියමයකින් හෝ, එවැනි යම් අවසර පත්‍රයක ඇතුළත් කොන්දේසි වෙනස් කරමින් හෝ එවැනි යම් අවසර පත්‍රයක් ප්‍රත්‍යාදිෂ්ට කරමින් 19 වන වගන්තිය යටතේ අධ්‍යක්ෂවරයා විසින් කරන ලද නියමයකින් හෝ 20 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ අධ්‍යක්ෂවරයා විසින් කරන ලද අණ කිරීමකින් හෝ අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, අවස්ථෝචිත පරිදි, ඒ අණ කිරීම හෝ ඒ නියමය නියම කෙරෙන දැන්වීමේ දින සිට දින තිහක් ඇතුළත ඊට විරුද්ධව අභියාචනයක් වෙරළ සංරක්ෂණය පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ හැකි ය. එවැනි යම් අභියාචනයක් සම්බන්ධයෙන් ලේකම්වරයාගේ තීරණය අවසානාත්මක වන්නේ ය.

දැනට පවත්නා යාත්‍රා කිරීමේ ඇලවල් නඩත්තු කිරීම හෝ හෑරීම සම්බන්ධයෙන් මේ කොටසේ විධිවිධාන අදාළ නොවිය යුතු බව.

**22.** භාර ඉවත් කරනු ලබන ද්‍රව්‍ය අධ්‍යක්ෂවරයා විසින් අනුමත කරනු ලැබූ බැහැර කිරීමේ ප්‍රදේශවල තැන්පත් කරනු ලබන්නේ නම්, දැනට පවත්නා යාත්‍රා කිරීමේ ඇලවල් නඩත්තු කිරීම හෝ හෑරීම හෝ සඳහා 14 වන වගන්තිය යටතේ අවසර පත්‍රයක් ලබා ගැනීමට යම් තැනැත්තකුට නියම කරනු ලබන්නේ යයි මේ පනතේ මේ කොටසෙහි කිසිවක් තේරුම් නොකළ යුතු ය.

## IV වන කොටස

### සාමාන්‍ය විධිවිධාන

අන්තර්කාලීන විධිවිධාන.

**23.** (1) 14 වන වගන්තියේ කුමක් සඳහන් වුව ද, නියමිත දිනයට ඉහතින්ම වූ දිනයෙහි බලපැවැත්වූ නීතියට අනුව නීත්‍යනුකූල වූ, වෙරළ කලාපය ඇතුළත යම් සංවර්ධන කාර්යයක ඒ නියමිත දිනයට ඉහතින්ම වූ දිනයෙහි නිරතව සිටි යම් තැනැත්තකු විසින්, ඒ කාර්යය සම්බන්ධයෙන් 14 වන වගන්තිය යටතේ අවසර පත්‍රයක් සඳහා වූ ඉල්ලීමක් නියමිත දිනයේ සිට දින විස්සක්

ඇතුළත කරනු ලබන අවස්ථාවක, ඒ ඉල්ලීම නිශ්චය කරනු ලබන තෙක් ඒ තැනැත්තා ඒ කාර්යයෙහි නිරතවීම නීත්‍යානුකූල විය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් තැනැත්තකු විසින් 14 වන වගන්තිය යටතේ අවසර පත්‍රයක් සඳහා කරන ලද ඉල්ලීමක් අධ්‍යක්ෂවරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක, ඒ ඉල්ලීම කරනු ලැබුවේ යම් සංවර්ධන කාර්යයක් සම්බන්ධයෙන් ද ඒ සංවර්ධන කාර්යය සඳහා හෝ ඒ සම්බන්ධයෙන් හෝ පාවිච්චි කරන ලද යම් උපකරණයක් නැතහොත් නිරවුරු ඒ ප්‍රතික්ෂේප කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් අත්හැර දැමීමට සිදුවන අවස්ථාවක, එසේ අත්හැර දමන ලද උපකරණ හෝ නිරවුරු වෙනුවෙන් සාධාරණ වන්දියක් ලැබීමට ඒ තැනැත්තාට හිමිකම ඇත්තේ ය.

පෙර වෙරළ සහ මුහුදු පත්ල පරිහරණය කිරීම සඳහා අවසර පත්‍ර.

24. (1) අධ්‍යක්ෂවරයා විසින් හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු විසින් හෝ සැලැස්ම කෙරෙහි සැලකිලිමත්ව නියම කරනු ලබන යම් කොන්දේසිවලට යටත්ව, පෙර වෙරළේ හෝ වෙරළ කලාපය ඇතුළත පිහිටි මුහුදු පත්ලේ හෝ යම් කොටසක් පරිහරණය කිරීම සඳහා අවුරුදු තුනක් නො ඉක්මවන යම් කාලයකට අවසරපත්‍ර නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) අවශ්‍ය යයි අධ්‍යක්ෂවරයා සලකන යම් පරීක්ෂණයකින් පසු, අවසර පත්‍රයට අදාළ කොන්දේසි කිසිවක් අවසර පත්‍රය දරන්නා විසින් කඩ කර ඇති බවට ඔහු සෑහීමට පත්වන්නේ නම්, අධ්‍යක්ෂවරයා විසින් ඒ අවසර පත්‍රය අවලංගු කරනු ලැබිය හැකි ය.

(3) අධ්‍යක්ෂවරයා විසින් හෝ අධ්‍යක්ෂවරයා විසින් ලියවිල්ල කින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු විසින් හෝ (1) වන උප වගන්තිය යටතේ අවසර පත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරමින් හෝ (2) වන උපවගන්තිය යටතේ අවසර පත්‍රයක් අවලංගු කරමින් හෝ කරන ලද යම් නියමයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් වෙරළ සංරක්ෂණය පිළිබඳ විෂයය භාර අමාත්‍ය වරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඊට විරුද්ධව අභියාච නය කළ හැකි ය. එවැනි යම් අභියාචනයක් සම්බන්ධයෙන් ලේකම් වරයා විසින් කරනු ලබන තීරණය අවසානාත්මක වන්නේ ය.

අපද්‍රව්‍ය හෝ ආගන්තුක ද්‍රව්‍ය වෙරළ කලාපය තුළට ඇතුළුවීම වැළැක්වීම සඳහා අධ්‍යක්ෂවරයා විධාන දිය යුතු බව.

**25.** (1) යම් අපද්‍රව්‍යයක් හෝ ආගන්තුක ද්‍රව්‍යයක් ඇතුළු වීමෙන් හෝ භෞතික ක්‍රියාකාරකමකින් වෙරළ කලාපයේ ජලයේ තත්ත්වය හෝ වෙරළ කලාපයේ ස්ථායිතාව හෝ කෙරෙහි හානි කර බලපෑමක් ඇති වන බව අධ්‍යක්ෂවරයා විසින් සොයා ගනු ලබන අවස්ථාවක, ඔහු විසින්,—

(අ) ඒ අපද්‍රව්‍යයෙහි හෝ ආගන්තුක ද්‍රව්‍යයෙහි හෝ ප්‍රභවය වෙරළ කලාපය ඇතුළත නම් නැතහොත් ඒ ක්‍රියාකාරකම ඇත්තේ වෙරළ කලාපයෙහි නම් ලිඛිත දැන්වීමක් මගින්, ඒ දැන්වීමෙහි සඳහන් නිරවද්‍ය කිරීමේ ක්‍රියාමාර්ග ගන්නා ලෙස හෝ ඒ ක්‍රියාකාරකමින් වැළකෙන ලෙස ඒ සම්බන්ධයෙන් වගකිව යුතු තැනැත්තාට නියම කළ යුතු ය; නව ද

(ආ) ඒ අපද්‍රව්‍යයෙහි හෝ ආගන්තුක ද්‍රව්‍යයෙහි ප්‍රභවය හෝ ඒ ක්‍රියාකාරකම වෙරළ කලාපය ඇතුළත නොවේ නම්, ඒ ඇතුළුවීම හෝ ක්‍රියාකාරකම වැළැක්වීම පිණිස අවශ්‍ය පියවර ගන්නා ලෙස උචිත පළාත් පාලන ආයතනයෙන් හෝ නියෝජ්‍යායතනයෙන් හෝ ඉල්ලීමක් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ අධ්‍යක්ෂවරයා විසින් ඉල්ලීමක් කරනු ලැබූ යම් පළාත් පාලන ආයතනයක් හෝ නියෝජ්‍යායතනයක් විසින් ඒ ඉල්ලීම අනුව ක්‍රියා කිරීමට ස්වකීය බලය ඇතුළත සියලු පියවර ගනු ලැබිය යුතු ය. එවැනි යම් ඉල්ලීමක් අනුව ක්‍රියා කිරීමට පළාත් පාලන ආයතනයකට නොහැකි වේ නම් ඒ පළාත් පාලන ආයතනය විසින් ඒ බව අධ්‍යක්ෂවරයා වෙත දැනුම් දිය හැකි අතර එසේ දැනුම් දෙනු ලැබූ විට ඒ ඇතුළු වීම හෝ ක්‍රියාකාරකම වැළැක්වීම පිණිස අවශ්‍ය පියවර අධ්‍යක්ෂවරයා විසින් ගනු ලැබිය යුතු ය.

ඇතුළුවීමේ බලතල.

**26.** අධ්‍යක්ෂවරයා විසින් හෝ ඔහු විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු විසින් හෝ වෙරළ කලාපය ඇතුළත වූ යම් ඉඩමකට යුක්ති සහගත යම් වේලාවක දී ඇතුළුව, යම් වැඩ යෝජනා ක්‍රමයක් ක්‍රියාවේ යෙදවීමේ හෝ මේ පනත යටතේ නිකුත් කරන ලද යම් අවසර පත්‍රයක සඳහන් කොන්දේසි අනුව ක්‍රියා කරනු ලබන්නේ ද නැතහොත් ක්‍රියා කරනු ලැබී ද යන වග නිසැකව දැන ගැනීමේ හෝ මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක යම් බලයක් ක්‍රියාත්මක කිරීමට හෝ යම් කර්තව්‍යයක් ඉටුකිරීමට මූලික වූ හෝ ආනුෂංගික වූ යම් සමීක්ෂණයක්, පරීක්ෂණයක් හෝ විමර්ශනයක් කිරීමේ කාර්යය සඳහා සාධාරණ ලෙස අවශ්‍ය යම් ක්‍රියා කිරීම නීත්‍යානුකූල විය යුතු ය.

වාර්තා.

**27.** මේ පනත යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක අධිකාරිය යටතේ වෙරළ කලාපය ඇතුළත යම් සංවර්ධන කාර්යයක නිරත වී සිටින යම් තැනැත්තකු වෙත අධ්‍යක්ෂවරයා විසින් යවනු ලබන ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, ඒ දැන්වීමෙහි නියම කරනු ලබන වාර්තා සහ තොරතුරු තමා වෙත සපයන ලෙස අධ්‍යක්ෂවරයා විසින් ඒ තැනැත්තාට නියම කළ හැකි අතර, ඒ දැන්වීමෙහි නියමයන් අනුව ක්‍රියා කිරීම ඒ තැනැත්තාගේ යුතුකම විය යුතු ය.

14 වන වගන්තියේ විධිවිධාන කඩ කිරීම මේ පනත යටතේ වරදක් බව.

**28.** (1) 14 වන වගන්තියේ විධිවිධාන කඩ කරමින් ක්‍රියාකරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, පළමුවරට කරන ලද වරදක් සම්බන්ධයෙන් නම් රුපියල් පන්සියයකට නොඅඩු වූ ද රුපියල් විසි පන් දහසක් නොඉක්මවන්නා වූ ද දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ දෙවන වරට කරන ලද නැතහොත් තදනන්තර වරදක් සම්බන්ධයෙන් නම් රුපියල් එක් දහසකට නොඅඩු වූ ද රුපියල් පනස් දහසක් නොඉක්මවන්නා වූ ද දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ ඒ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ විට, ඒ වරද සිදුකිරීමෙහිලා හෝ ඒ සම්බන්ධයෙන් හෝ පාවිච්චි කරන ලද යම් යාත්‍රාවක්, නැවක්, බෝට්ටුවක්, වාහනයක්, උපකරණයක් හෝ යන්ත්‍රයක් ඒ යාත්‍රාවෙහි, නැවෙහි, බෝට්ටුවෙහි හෝ වාහනයෙහි තිබී සොයා ගනු ලබන යම් භාණ්ඩයක් හෝ ද්‍රව්‍යයක්ද සමඟ රාජ්‍යසන්තක බව ප්‍රකාශ කරමින් මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥාවක් කරනු ලැබිය හැකි ය. ඒ ආඥාව කරනු ලැබූ විට ආඥාවෙහි සඳහන් දේපළ නිරපේක්ෂ වශයෙන් රාජ්‍යය සතුවිය යුතු ය. ඒ සතු වීම—

(අ) රාජ්‍යසන්තක කිරීමේ ආඥාවට විරුද්ධව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකිවන්නේ යම් කාලයක් ඇතුළත ද ඒ කාලය ඉකුත් වීමෙන් පසුව; හෝ

(ආ) රාජ්‍යසන්තක කිරීමේ ආඥාවට විරුද්ධව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක, රාජ්‍යසන්තක කිරීමේ ආඥාව ස්ථිර කරමින් හෝ අනුමත කරමින් අභියාචනය තීරණය කරනු ලැබූ විට; හෝ

බලාත්මක විය යුතු ය:

එසේ වුවද යම් යාත්‍රාවක්, නැවක්, බෝට්ටුවක්, වාහනයක්, උපකරණයක්, යන්ත්‍රයක්, භාණ්ඩයක් හෝ ද්‍රව්‍යයක් වරද සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ තැනැත්තා නොවන වෙනත් තැනැත්තකුට අයත් බව ඔප්පු කරනු ලැබුවහොත්, සහ වරද සිදුකිරීමෙහිලා හෝ ඒ සම්බන්ධයෙන් එය පාවිච්චි කරනු ලබන්නේ යයි තමා දැන නොසිටි බව ඒ වෙනත් තැනැත්තා විසින් අධිකරණය සෑහීමට පත් කරනු ලැබුවහොත් ඒ යාත්‍රාව, නැව, බෝට්ටුව, වාහනය, උපකරණය, යන්ත්‍රය, භාණ්ඩය හෝ ද්‍රව්‍යය මුදාහරිමින් අධිකරණය විසින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.

29. (අ) 25 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ අධ්‍යක්ෂවරයා විසින් යවන ලද දැන්වීමක නියම අනුව ක්‍රියා කිරීම පැහැර හරින්නා වූ; වැරදි.

(ආ) අධ්‍යක්ෂවරයා වෙත හෝ යම් නිලධරයකු වෙත පවරන ලද යම් බලයක් ක්‍රියාත්මක කිරීමේ දී ඒ අධ්‍යක්ෂවරයාට හෝ ඒ නිලධරයාට ප්‍රතිරෝධය පාන්නා වූ හෝ බාධා පමුණුවන්නා වූ;

(ඇ) 27 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමක නියම අනුව ක්‍රියා කිරීම පැහැර හරින්නා වූ;

(ඈ) 27 වන වගන්තිය යටතේ අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කරන ලද දැන්වීමක් අනුව ක්‍රියා කිරීමේ දී තමා විසින් සපයන ලද යම් වාර්තාවක හෝ තොරතුරක අසත්‍ය හෝ සාවද්‍ය බව තමා දන්නා යම් ප්‍රකාශයක් කරන්නා වූ

යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් එක්දහස් පන්සියයකට නොඅඩු වූ ද රුපියල් විසිපන්දහසක් නොඉක්මවන්නා වූ ද දඩයකට හෝ මාස හයක් නොඉක්මවන්නා වූ කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

30. (1) මේ පනත යටතේ වරදකට වරදකරු වන සෑම තැනැත්තකුම, 28 වන සහ 29 වන වගන්ති යටතේ නියම කර ඇති දඩවලට අතිරේකව, වරදකරු කරනු ලැබීමෙන් පසු වරද නොකඩව කරගෙන යනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය. අතිරේක දඩය.

(2) මේ පනත, ඔත්තු සපයන්නන්ට තෑගි දීමේ ආඥාපනතේ උපලේඛනයෙහි දක්වා ඇති ප්‍රඥප්තියක් ලෙස සලකනු ලැබිය යුතු ය.

31. (1) කිසිම තැනැත්තකු විසින් නියමිත දින සිට වෙරළ කලාපයෙහි යම් කොටසක අනවසරයෙන් කරන ලද කිසියම් ඉදිකිරීමක්, නිවාසයක්, ගෙපතක්, මඩුවක් හෝ වෙනත් ගොඩනැගිල්ලක් ඉදිකිරීම හෝ ගොඩ නැඟීම හෝ කරනු නොලැබිය යුතු ය. අනවසරයෙන් කරන ලද ඉදිකිරීම් ආදිය බිඳ හෙළීම.

(2) ඒ ඉදි කිරීමෙහි, නිවාසයෙහි, ගෙපතෙහි, මඩුවෙහි හෝ වෙනත් ගොඩනැගිල්ලෙහි ප්‍රකටව පෙනෙන යම් කොටසක දැන්වීමක් ඇලවීමෙන් අවස්ථාවෝචිත පරිදි, අයිතිකරු හෝ පදිංචිකරු වෙත කරනු ලබන දැනුම් දීමක් මගින් අධ්‍යක්ෂවරයා විසින්, ඒ දැන්වීමෙහි ඔහු විසින් සඳහන් කරනු ලබන යම් කාලයක් ඇතුළත, ඒ අනවසරයෙන් කරන ලද ඉදිකිරීම, නිවාසය, ගෙපත, මඩුව හෝ වෙනත් ගොඩනැගිල්ල බිඳ හෙළා ඉවත් කරන ලෙස එහි අයිතිකරුට හෝ පදිංචිකරුට විධාන කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ අධ්‍යක්ෂවරයා විසින් කරන ලද යම් විධානයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, දැන්වීම අලවනු ලැබූ දින සිට දින තුනක් ඇතුළත ඊට විරුද්ධව

වෙරළ සංරක්ෂණය විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනය කළ හැකි ය. එවැනි අභියාචනයක් සම්බන්ධයෙන් ලේකම්වරයාගේ තීරණය අවසානාත්මක විය යුතු ය.

(4) දැන්වීමෙහි සඳහන් කාලය ඇතුළත හෝ අභියාචනය ප්‍රතික්ෂේප කරනු ලැබූ විටක ලේකම්වරයා විසින් නියම කරනු ලබන යම් කාලයක් ඇතුළත හෝ එවැනි යම් ඉදි කිරීමක්, නිවාසයක්, ගෙපතක්, මඩුවක් හෝ වෙනත් ගොඩනැගිල්ලක් බිඳ හෙළා ඉවත් කර නොමැති අවස්ථාවක, අධ්‍යක්ෂවරයා විසින් ඒ ඉදි කිරීම, නිවාසය, ගෙපත, මඩුව හෝ වෙනත් ගොඩනැගිල්ල බිඳ හෙළා ඉවත් කරනු ලැබීමට සැලැස්විය යුතු අතර, එසේ කිරීමෙහි ලා අධ්‍යක්ෂවරයා විසින් දරන ලද වියදම් රජයට ලැබිය යුතු ණයක් වශයෙන් එහි අයිතිකරුගෙන් හෝ පදිංචිකරුගෙන් හෝ අයකර ගනු ලැබිය යුතු ය.

නියෝග.

32. (1) මේ පනත යටතේ යම් කාරණයක් සම්බන්ධයෙන් නියෝග සෑදීමට බලය දී තිබේ ද නැතහොත් යම් කාරණයක් සම්බන්ධයෙන් නියෝග සෑදීමට නියම කර තිබේ ද එවැනි යම් කාරණයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, ඒ නියෝග, එසේ පළ කරනු ලැබූ දිනයෙහි හෝ නියෝගයෙහි සඳහන් යම් පසු දිනයක හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එහි අනනුමතයේ දින සිට, එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැතිව, පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය. යම් නියෝගයක් යම් දිනයක සිට එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබේ ද ඒ දිනය පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

ආරක්ෂා කිරීම.

33. (1) රජයේ ඉඩම් ආඥාපනතේ 62 වන වගන්තිය යටතේ දිසාපතිවරයකු විසින් හෝ නියමිත නිලධරයකු විසින් හෝ නිකුත් කරන ලද සෑම අවසර පත්‍රයක්ම, මේ පනතේ 24 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) රජයේ ඉඩම් ආඥාපනතේ 59 වන වගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම, මේ පනතේ 32 වන වගන්තිය යටතේ සාදන ලද නියෝගයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) රජයේ ඉඩම් ආඥාපනතේ 63 වන වගන්තිය යටතේ ප්‍රදානය කරන ලද සෑම බලපත්‍රයක් ම, මේ පනතේ 14 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

34. වෙරළ කලාපය හෝ වෙරළ කලාපයේ පස හෝ ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 22 දරන සමුද්‍රීය කලාප පිළිබඳ පනත යටතේ ශ්‍රී ලංකාවේ දේශීය ජලතීරය ලෙස ප්‍රකාශිත සමුද්‍ර ප්‍රදේශය විෂයයෙහි නැතහොත් ඒ සම්බන්ධයෙන් ජනරජයට ඇති බලතල හෝ අයිතිවාසිකම් මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හීන වන්නේ යයි තේරුම් නොකළ යුතු ය.

*ජනරජයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.*

35. මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ හෝ අධ්‍යක්ෂවරයා, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු, යම් සහකාර අධ්‍යක්ෂවරයකු, හෝ වෙනත් නිලධරයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ අධ්‍යක්ෂවරයාට, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයාට, සහකාර අධ්‍යක්ෂවරයාට හෝ වෙනත් නිලධරයාට විරුද්ධව කිසිම සිවිල් නඩුවක්, අපරාධ නඩුවක් හෝ වෙනත් නඩු කටයුත්තක් පවරනු නොලැබිය යුතු ය.

*සද්භාවයෙන් කරන ලද ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.*

## V වන කොටස

## ඇතැම් ලිඛිත නීති සංශෝධනය කිරීම සහ සුළු වශයෙන් වෙනස් කිරීම

36. (1) (අ) වෙරළ කලාපය සම්බන්ධයෙන් යම් සංවර්ධන කාර්යයක නිරත වීමට යම් තැනැත්තකුට බලය දෙන යම් අවසර පත්‍රයක් හෝ වෙනත් අධිකාරයක් ප්‍රදානය කිරීමට ; හෝ

(ආ) වෙරළ කලාපයට අදාළව යම් වැඩ යෝජනා ක්‍රම සකස් කිරීමට හෝ ඒවා ක්‍රියාවෙහි යෙදවීමට

යම් බලයක් හෝ කාර්යයක් යම් තැනැත්තකු හෝ අධිකාරියක් වෙත පවරන හෝ නියම කරන විධිවිධානයක් යම් ලිඛිත නීතියක ඇති අවස්ථාවක, වෙරළ සංරක්ෂණ විෂයය භාර අමාත්‍යවරයා විමසීමෙන් පසුව පමණක් ඒ බලය ක්‍රියාත්මක කිරීමට හෝ ඒ කාර්ය ඉටු කිරීමට ඒ තැනැත්තාට හෝ අධිකාරියට හැකියාව ලැබෙන්නේ යයි නැතහොත් නියම වන්නේ යයි යනුවෙන් ඒ විධිවිධානය තේරුම් කරනු ලැබිය යුතු ය.

*ඇතැම් ලිඛිත නීති වෙරළ කලාපයට අදාළ කිරීම.*

2—ඒ 57194 (81/07)

(2) මේ පනතේ 39 වන, 40 වන, 41 වන සහ 42 වන වගන්ති වලින් කරනු ලබන සංශෝධනවලින් (1) වන උපවගන්තියේ විධිවිධානවල ව්‍යාප්තිය කෙරෙහි හානියක් නොවන්නේ ය.

නිවාස සහ නගර සංවර්ධන ආඥාපනතේ 56 වන වගන්තිය සංශෝධනය කිරීම.

**37.** නිවාස සහ නගර සංවර්ධන ආඥාපනතේ 56 වන වගන්තිය අගට පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(4) වෙරළ සංරක්ෂණ විෂයය භාර අමාත්‍යවරයා විමසීමෙන් පසුව මිස, වෙරළ කලාපය ඇතුළත පිහිටි යම් ප්‍රදේශයක් සඳහා සැලසුම් කරන ලද යම් සංවර්ධන යෝජනා ක්‍රමයකට අනුමතය දීමට අමාත්‍යවරයාට බලය පැවරෙන්නේ යයි මේ වගන්තියෙහි ඇතුළත් කිසිවක් තේරුම් නොකළ යුතු ය.

මේ උපවගන්තියෙහි "වෙරළ කලාපය" යන්නෙහි 1981 වෙරළ සංරක්ෂණ පනතෙහි ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය.".

නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම.

**38.** නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 29 වන වගන්තිය අගට පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(3) වෙරළ සංරක්ෂණ විෂයය භාර අමාත්‍යවරයා විමසීමෙන් පසුව මිස, වෙරළ කලාපය ඇතුළත පිහිටි යම් ඉඩම් ප්‍රදේශයකට අදාළ යම් විධිවිධානයක් ඇතුළත් යම් යෝජනා ක්‍රම කෙටුම්පතක් 25 වන වගන්තිය හෝ 28 වන වගන්තිය හෝ යටතේ අමාත්‍යවරයා විසින් තාවකාලික වශයෙන් අනුමත කිරීම හෝ ඊට අනුඥාව දීම හෝ නොකළ යුතු ය.

මේ උපවගන්තියෙහි "වෙරළ කලාපය" යන්නෙහි 1981 වෙරළ සංරක්ෂණ පනතෙහි ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය."

1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ 7 වන සහ 8 වන වගන්ති ඉවත් කිරීම.

**39.** 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ 7 වන සහ 8 වන වගන්ති මෙයින් ඉවත් කරනු ලැබේ.

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 4 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

**40.** ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 4 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 13 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ උපවගන්තියේ (iii) වන ඡේදයේ "ඇත්දැයි සොයා බැලීමට" යන වචන වෙනුවට "ඇත්දැයි සොයා බැලීමට ; සහ" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ උපවගන්තිය අගට පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :—

"(iv) 1981 වෙරළ සංරක්ෂණ පනතෙහි අර්ථ කථනය කර ඇති පරිදි, වෙරළ කලාපය ඇතුළත පිහිටි යම් ඉඩමක යම් ඛනිජ ද්‍රව්‍ය කැනීම හෝ ඇත්දැයි සොයා බැලීම වෙරළ සංරක්ෂණ විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමතය නොමැතිව නොකිරීමට.".

**41.** පස සංරක්ෂණ පනතේ 11 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් එහි ඇතුලත් කරනු ලබන අතර එය ඒ පනතේ 11අ වගන්තිය වශයෙන් බලාත්මක විය යුතු ය :— පස සංරක්ෂණ පනතේ 11අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

'ව්‍යතිරේක අදාළ කිරීම.

11අ. (1) වෙරළ කලාපය ඇතුළත පිහිටි යම් ඉඩම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් 3 වන වගන්තිය යටතේ යම් නියමයක් කිරීමට අමාත්‍යවරයාට බලය පැවරෙන්නේ යයි ඒ වගන්තියෙහි ඇතුලත් කිසිවක් තේරුම් නොකළ යුතු ය.

(2) වෙරළ කලාපය ඇතුළත පිහිටි යම් ඉඩම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් වූ ද මේ වගන්තිය බලාත්මක වන දිනයෙහි වලංගුව බලපැවතියා වූ ද 3 වන වගන්තිය යටතේ වූ සෑම නියමයක් ම ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) වෙරළ කලාපය ඇතුළත පිහිටි යම් ඉඩමක් සම්බන්ධයෙන් හෝ එවැනි ඉඩමකට අදාළව හෝ 6 වන වගන්තිය යටතේ නියෝග සෑදීමට අමාත්‍යවරයාට බලය පැවරෙන්නේ යයි ඒ වගන්තියෙහි ඇතුලත් කිසිවක් තේරුම් නොකළ යුතු ය.

(4) 6 වන වගන්තිය යටතේ සාදනු ලැබ මේ වගන්තිය බලාත්මක වන දිනයෙහි ක්‍රියාත්මකව පැවති සෑම නියෝගයක් ම, වෙරළ කලාපය ඇතුළත පිහිටි යම් ඉඩමකට හෝ ඉඩමක් සම්බන්ධයෙන් හෝ අදාළ නොවන්නේ යයි සලකනු ලැබිය යුතු ය.

මේ වගන්තියෙහි "වෙරළ කලාපය" යන්නෙහි 1981 වෙරළ සංරක්ෂණ පනතෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය.'.

**42.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි— අර්ථ නිරූපණය.

"වෙරළ" යන්නෙන්, මුහුදු ජලයෙන් යට වී නොමැති මුහුදට යාබද බිම් තීරය අදහස් වේ ;

"වෙරළ සංරක්ෂණය" යන්නෙන්, මුහුදු කැමෙන් හෝ මුහුදට යටවීමෙන් වෙරළ ආරක්ෂා කිරීම සහ සුරක්ෂිත කිරීම අදහස් වන අතර, වෙරළ කලාපය ඇතුළත සංවර්ධන කටයුතු සැලසුම් කිරීම සහ කළමනාකරණය කිරීම ද ඊට ඇතුලත් වේ ;

"වෙරළ කලාපය" යන්නෙන්, මාධ්‍ය වඩදිය ඉම සිට ගොඩබිම් දෙසට මීටර් තුන්සියයක සීමාවක් සහ මාධ්‍ය බාදිය ඉම සිට මුහුද දෙසට කිලෝ මීටර් දෙකක සීමාවක් ඇතුළත පිහිටි ප්‍රදේශය අදහස් වන අතර ස්ථිර වශයෙන් හෝ කලින් කල මුහුදට සම්බන්ධ වූ ගංගා, දිය පාරවල්, කලපු හෝ වෙනත් යම් ජලකඳක් සම්බන්ධයෙන් වන විට, ගොඩ බිම දෙසට වූ මායිම, ඒවායේ ස්වාභාවික ඇතුළුවීමේ ලක්ෂ්‍ය

අතර අඳිනු ලද සෘජු පාද රේඛාවකට ලම්බකව මනිනු ලද කිලෝ මීටර් දෙකක සීමාවකට ව්‍යාප්ත විය යුතු අතර, එසේ මුහුදට සම්බන්ධ වූ ඒ ගංගා, දිය පාරවල් සහ කලපු හෝ වෙනත් යම් ජලකඳක් ද ඊට ඇතුළත් වේ;

" වෙරළ ඉම " යන්නෙන්, මධ්‍ය මුහුදු මට්ටමේ දී ජල තලය වෙරළ සමඟ ඡේදනය වීන රේඛාව අදහස් වේ;

" සංවර්ධන කාර්යය " යන්නෙන්, කවර හෝ ආකාරයකින් වෙරළ කලාපයේ භෞතික ස්වභාවය වෙනස් කිරීමට ඉඩ ඇති යම් කාර්යාවලියක් අදහස් වන අතර, ගොඩනැගිලි සහ කර්මාන්ත ඉදි කිරීම; මෝයවලින්, යාත්‍රාවලින් හෝ වෙනත් මාර්ගවලින් අපද්‍රව්‍ය හෝ වෙනත් ද්‍රව්‍ය තැන්පත් කිරීම; වැලි, හිරිගල්, ඔප්පි කටු, ස්වාභාවික වෘක්ෂලතා දිය, මුහුදු පැලෑටි හෝ වෙනත් ද්‍රව්‍ය ඉවත් කිරීම; හෑරීම සහ පිරවීම; ඉඩම් සංස්කරණය සහ ඛනිජ ද්‍රව්‍ය සඳහා කැණීම හෝ හෑරීම ඊට ඇතුළත් වන නමුත් මසුන් ඇල්ලීම ඊට ඇතුළත් නොවේ;

" පරිසරය කෙරෙහි බලපෑම පිළිබඳ තක්සේරුව " යන්නෙන්, යෝජිත සංවර්ධන කාර්යයකින් ඇති විය හැකි පරිසරය හා සම්බන්ධ ප්‍රතිඵල පිළිබඳ ලිඛිත විශ්ලේෂණයක් අදහස් වන අතර, යෝජිත කාර්යය පිළිබඳ විස්තරයක් ද, යෝජිත සංවර්ධන කාර්යයෙන් පරිසරය විෂයයෙහි ඇති වන වැළැක්විය හැකි සහ වැළැක්විය නොහැකි අනිෂ්ට ප්‍රතිඵල පිළිබඳ විස්තරයක්, වෙරළ කලාපයේ පරිසරයට අඩු හානිකර වූ ඒ කාර්යයට ඇති විකල්ප පිළිබඳ විස්තරයක් සමඟ ඒ විකල්ප ප්‍රතික්ෂේප කිරීමට හේතු ද සහ යෝජිත සංවර්ධන කාර්යය සඳහා අවශ්‍ය වෙනස් කළ නොහැකි හෝ ආපසු ලබා ගත නොහැකි සම්පත් භාවිතය පිළිබඳ විස්තරයක් ද ඊට ඇතුළත් වේ;

" අපර වෙරළ " යන්නෙන්, මධ්‍ය වඩදිය ඉම සහ මධ්‍ය බාදිය ඉම අතර වූ මුහුදු වෙරළ ප්‍රදේශය අදහස් වේ;

" ඉඩම " යන්නට, මුහුදු පත්ල සහ මුහුදු පත්ලේ හෝ මුහුදු වෙරළේ රැඳී ඇති යම් දෙයක් ඇතුළත් වේ;

" පළාත් පාලන ආයතනය " යන්නෙන්, යම් සංවර්ධන සභාවක්, මහ නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වන අතර ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරනු සහ ඉටු කරන බලතලවලට, කාර්යවලට

සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇති කොට පිහිටුවන ලද කවර වූ හෝ යම් අධිකාරියක් ද ඊට ඇතුළත් වේ;

"ද්‍රව්‍ය" යන්නට, ඛනිජ ද්‍රව්‍ය, පිඩැලි, මුහුදු පැලෑටි සහ වෙනත් යම් වෘක්ෂලතාදිය ඇතුළත් වේ;

"මාධ්‍ය වඩදිය ඉම" යන්නෙන්, මාධ්‍ය මුහුදු මට්ටම් රේඛාවේ සිට ධන මීටර් 0.6 ක් අදහස් වේ;

"මාධ්‍ය බාදිය ඉම" යන්නෙන්, මාධ්‍ය මුහුදු මට්ටම් රේඛාවේ සිට ඍණ මීටර් 0.6 ක් අදහස් වේ;

"වැඩ යෝජනා ක්‍රමය" යන්න, වෙරළ සංරක්ෂණය හෝ වෙරළ කලාපය හෝ සම්බන්ධයෙන් යෙදී ඇති විට, ඉදි කිරීමේ, වෙනස් කිරීමේ, බිඳ හෙලීමේ, කැණීමේ, ගොඩ කිරීමේ, අළුත්වැඩියා කිරීමේ හෝ නඩත්තු කිරීමේ යම් වැඩක් ඉන් අදහස් වන අතර, මුහුදු කෑමෙන් හෝ මුහුදට යටවීමෙන් වෙරළ කලාපය ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා හෝ, වෙරළ කලාපය සංවර්ධනය කිරීම සඳහා හෑරීම සහ කැණීම, යම් ද්‍රව්‍ය ඉවත් කිරීම හෝ ගොඩ ගැසීම හෝ වෘක්ෂලතාදිය වැපිරීම හෝ සිටුවීම ද ඊට ඇතුළත් වේ;

"මුහුද" යන්නට, යම් දිය ඇළක, කුඩා කලපුවක, බොක්කක, මෝයක හෝ යම් ගංගාවක වඩදිය ගලා යන දුරස්ථම ස්ථානය දක්වා විහිදෙන ඒ දිය ඇළේ, කුඩා කලපුවේ, බොක්කේ, මෝයේ හෝ ගංගාවේ ජලය ඇතුළත් වේ;

"සෘජු පාදක රේඛාව" යන්නෙන්, දේශීය සමුද්‍රයේ සීමාවන් මනිනු ලබන්නා වූ පාදක රේඛාව වන ශ්‍රී ලංකා දේශීය සමුද්‍රය ප්‍රකාශයට පත් කෙරෙන ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 22 දරන සමුද්‍රීය කලාප පිළිබඳ පනතේ 2 වන වගන්තිය යටතේ කරන ලද ප්‍රකාශනයෙහි සඳහන් පාදක රේඛාව අදහස් වේ; තවද

"දේශීය සමුද්‍රය" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 22 දරන සමුද්‍රීය කලාප පිළිබඳ පනත යටතේ කරන ලද ප්‍රකාශනය මගින් ශ්‍රී ලංකාවේ දේශීය සමුද්‍රය ලෙස ප්‍රකාශිත මුහුදු ප්‍රදේශය අදහස් වේ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.